# (ඉ) මුදල් සැපැයුම

1962 වසර තුළ මුදල් සැපැයුම, රුපියල් කෝටි 128·9 සිට රුපියල් කෝටි 134·3 ක් වීමෙන් රුපියල් කෝටි 5.4 කින් වැඩිවිය. එහෙත් පසුගිය වසරේ වැඩිවීම රුපියල් කෝටි 8·0 ක් විය. මේ වැඩිවීම සියයට ගණනක් වශයෙන් දක්වන්නේ නම්, 1961 වැඩිවීම සියයට 6·6 ක් වූ අතර 1962 වැඩිවීම සියයට 4·2 ක් වී ඇත. 1962 මුල් පස් මාසය තුළ මුදල් සැපැයුමෙහි වෙනස් වීම් පුරුදු මගින් පිට පැන්නේය. මෙයට හේතු වූයේ, වෙළෙඳ බැංකු සහ වෙළෙඳ බැංකු සේවක යන් අතර ඇතිවූ ආරාවුල් තත්ත්වය නිසා සාමාන්‍ය බැංකු කටයුතු තාවකාලිකව ඇණහිටීමය. වෙළෙඳ බැංකු සිරිත් පරිදි සිය කටයුතු කරගෙන ගිය 1961 නොවැම්බර් මාසයේදී මුදල් සැපැයුම රුපියල් කෝටි 125·1 ක් විය. දෙසැම්බර් මාසයේදී මුදල් සැපැයුම, රුපියල් කෝටි 128·9 තෙක් ඉහළ ගියේය. ඊට පසු මුදුන් පෙත්තට නැගුන මුදල් සැපයුම1962 මාර්තු මාසයේදී රුපියල් කෝටි 163·5 ක් විය. අප්‍රේල් මාසයෙන් පසු මුදල් සැපැයුම තරමක් අඩු වන්නට පටන් ගත්තේ, ජූනි මාසයේ සිරිත් පරිදි වෙළෙඳ බැංකු, සිය කටයුතු අරඹන විට, මුදල් සැපැයුම රුපියල් කෝටි 129·8 ක් ව තිබිණි.

මේ මාසවලදී මුදල් සැපැයුම ප්‍රමාණවත් ලෙස වැඩිවීමට ප්‍රධාන හේතුව වූයේ සිරිත් පරිදි බැංකු කටයුතු නොකැරී ඇණහිටීම විය. මේ ආරාවුල පැවැති කාලය තුළ බැංකු කටයුතු කැරුනේ ඉතාමත් සීමිත ප්‍රමාණයකටය. මෙය ප්‍රධාන වශයෙන්ම චෙක්පත් මුදල් කර ගැනීමට පමණක් සීමා විය. ගිණුම්වලට මුදල් බැර කිරීම සහ නොගෙවා ඉතිරිව ඇති නියෝගයන් සඳහා ගෙවීම වැනි අනෙකුත් සාමාන්‍ය බැංකු කටයුතු අත් හිටවන ලදී. තවද සිරිත් පරිදි නිෂ්කාශනාගාරය මගින් යැවියයුතු චෙක්පත්, එසේ නොයවා තම තමන්ගේ ගිණුම්වලට, බැරකර ගැනීමේ පහසුකම් වෙළෙඳ බැංකු විසින් සිය අනුග්‍රාහකයින්ට සලසා දෙන ලදී. අන්තර් බැංකු චෙක්පත් නිෂ්කාශනය, ආරාවුල පැවැති මුලු කාලයේදී සහ ඊට පසුව සති ගණනෙක් ගතවන තෙක්ම අත්හිටවා තිබිණි. අන්තර් බැංකු චෙක්පත් නිෂ්කාශනය, තාවකාලිකව අත්හිටවීම නිසා නිෂ්කාශනාගාරය මගින්, ඉදිරිපත් නොකළ චෙක්පත් අනුග්‍රාහකයාගේ ගිණුමට බැර කිරීමෙන් බැංකු තැන්පතු උද්ධමන ස්වභාවයක් ඉසිලීය. මෙයට අමතරව විශ්වාසය තහවුරු වී ඇති අනුග්‍රාහකයන්ට ප්‍රධාන වශයෙන් අයිරාවන් මාර්ගයෙන්, ණය පහසුකම් සැලසීම ද මුදල් සැපැයුම වැඩිවීමට එක්තරා හේතුවක් විය. ඇත්තේ හැටියට සලකන විට 1962 මුල් හාර මාසයේදී මුදල් සැපැයුමෙහි ඇති වූ වැඩිවීම, හුදු සංඛ්‍යා වලින් පමණක් දිස්වන්න ක් විය.

1962 ජූලි මාසයෙන් පසු මුදල් සැපැයුම දැඩිලෙස පහළ වැටීම ඇරැඹුනේ, අන්තර් බැංකු නිෂ්කාශනය ඇරැඹීමත්, පුද්ගලයන්ගේ ගිණුම් සත්‍ය ප්‍රමාණයට අඩුවීමත් නිසාය. 1962 අගෝස්තු අවසාන වන විට 1961 අවසානයේදී ට වඩා මුදල් සැපැයුම රුපියල් කෝටි 1·9 කට ආසන්න ගණනකින් අඩුවී ඇති බව දැක්ක හැකිය. එසේ වුවද අගෝස්තු අවසානය වන විට, පැවැති සංඛ්‍යාව 1961 අගෝස්තු මාසයේ පැවැති සංඛ්‍යාවට වඩා දළ වශයෙන් රුපියල් කෝටි 3·9 කින් වැඩිය. මෙයින් පිළිබිඹු වන අනෙක් කරුණ නම්, වෙළෙඳ බැංකු සහ බැංකු සේවකයන් අතර ආරාවුල නිසා මුදල් සැපැයුමෙහි ඇති වූ අනියම් වැඩිවීමත් සමගම 1962 දී මුදල් සැපැයුම, ඇත්තෙන්ම වැඩිවී ඇති බවයි. මුදල් සැපැයුම තරමක් පහළ වැටුන නොවැම්බර් මාසයේදී හැර 1962 අවසාන හාර මාසය තුළදී මුදල් සැපැයුම සාමාන්‍යයෙන් නගින අතට හැරී තිබිණි. නොවැම්බර් මාසයේදී ඇතිවූ අඩුව, දෙසැම්බර් මාසයේ ඇතිවූ ප්‍රමාණවත් වැඩිවීම නිසා බොහෝ සෙයින් සමහන් වී ගියේය. සැප්තැම්බර් සහ ඔක්තෝබර් අතර මුදල් සැපැයුමෙහි වැඩිවීම රුපියල් කෝටි 2·4 ක් විය. එහෙත් දෙසැම්බර් මාසයේදී එය රුපියල් කෝටි 3·6 ක් විය.

සංඛ්‍යා සටහන II ඉ — 1

## මුදල් සැපැයුම

රුපියල් දශ ලක්ෂ

| කාලච්ඡේදය අවසානයේදී | 1957 | 1958 | 1959 | 1960 | 1961 | 1962 | (1957 න් 1958 ට වූ) වෙනස % | (1958 න් 1959 ට වූ) වෙනස % | (1959 න් 1960 ට වූ) වෙනස % | (1960 න් 1961 ට වූ) වෙනස % | (1961 න් 1962 ට වූ) වෙනස % |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි .. | 1,131 | 1,014 | 1,050 | 1,180 | 1,207 | 1,426 | − 10·3 | + 3·6 | + 12·4 | + 2·3 | + 18·1 |
| පෙබරවාරි .. | 1,105 | 1,016 | 1,053 | 1,192 | 1,193 | 1,561 | − 8·1 | + 3·6 | + 13·2 | + 0·1 | + 30·8 |
| මාර්තු .. | 1,107 | 1,023 | 1,089 | 1,194 | 1,210 | 1,635 | − 7·6 | + 6·5 | + 9·6 | + 1·3 | + 35·1 |
| අප්‍රේල් .. | 1,082 | 1,032 | 1,084 | 1,165 | 1,306 | 1,448 | − 4·6 | + 5·0 | + 7·5 | + 12·1 | + 10·9 |
| මැයි .. | 1,061 | 1,000 | 1,096 | 1,163 | 1,219 | 1,317 | − 5·7 | + 9·6 | + 6·1 | + 4·8 | + 8·0 |
| ජූනි | 1,045 | 1,015 | 1,094 | 1,170 | 1,221 | 1,298 | − 2·9 | + 7·9 | + 6·9 | + 4·4 | + 6·3 |
| ජූලි | 1,056 | 1,023 | 1,094 | 1,150 | 1,223 | 1,277 | − 3·1 | + 6·9 | + 5·1 | + 6·3 | + 4·4 |
| අගෝස්තු .. | 1,024 | 1,022 | 1,095 | 1,161 | 1,231 | 1,270 | − 0·2 | + 7·1 | + 6·0 | + 6·0 | + 3·2 |
| සැප්තැම්බර් .. | 1,046 | 1,072 | 1,128 | 1,181 | 1,261 | 1,294 | + 2·5 | + 5·2 | + 4·7 | + 6·8 | + 2·6 |
| ඔක්තෝබර් .. | 1,052 | 1,085 | 1,153 | 1,212 | 1,248 | 1,317 | + 3·1 | + 6·3 | + 5·1 | + 3·0 | + 5·5 |
| නොවැම්බර් .. | 1,049 | 1,070 | 1,170 | 1,219 | 1,251 | 1,307 | + 2·0 | + 9·3 | + 4·2 | + 2·6 | + 4·5 |
| දෙසැම්බර් .. | 1,040 | 1,077 | 1,178 | 1,209 | 1,289 | 1,343 | + 3·6 | + 9·4 | + 2·6 | + 6·6 | + 4·2 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

සිරිත් පරිදි කැරෙන බැංකු කටයුතු, අවුරුද්දේ මුල් හාර මාසය තුළදී අත්හිටවීමට සිදුවීම නිසා මුදල් සැපැයුමෙහි ප්‍රධාන අංගයක් වී ඇති මහජනයා අතෙහි ගැවසෙන නෝට්ටු හා කාසි ප්‍රමාණය වැඩිවිය. 1961 අවසානය වන විට, රුපියල් කෝටි 69·22 ක් ව තුබුණ මෙය 1962 පෙබරවාරි මාසය වන විට රුපියල් කෝටි 76·61 තෙක් ඉහළ ගියේය. මෙය වසර තුළ ඇතිවූ ඉහළම මට්ටම විය. මෙයින් පසු මහජනයා අතෙහි ගැවසුන මුදල් ප්‍රමාණය කෙමෙන් අඩු වන්නට විය. 1962 අවසානය වන විට, මහජනයා සතුව තුබූ මුළු මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 71·26 ක් විය. මෙය 1961 දෙසැම්බර් මාසයේ අවසාන වන විට තුබූ ප්‍රමාණයට වඩා රුපියල් කෝටි 2·04 කින් වැඩිය. අවුරුද්ද තුළ ඇතිවූ හැඩගැස්ම මුළුමනින් ගෙන බලන විට, මේ අවුරුද්දේ මුදල් සැපැයුම පසුගිය පස් වසර තුළ පැවැති පිළිවෙළට මඳක් වෙනස් විය. පසුගිය පස් වසර තුළ මුදල් සැපැයුමෙහි ව්‍යවහාර මුදල් ප්‍රමාණය, ඉල්ලුම් තැන්පතු ප්‍රමාණයට වඩා, වැඩිවී තිබිණි. 1961 වාර්ෂික වාර්තාවෙන් මේ හැඩගැස්ම ගැන අවධානය යොමු කරන ලදී. ව්‍යවහාර මුදල්, මුදල් සැපැයුමෙහි අනුපාතයක් වශයෙන් ගත් විට මේ අවුරුද්දේ එය සියයට 53·1 ක් වූ අතර පසුගිය අවුරුද්දේ අවසානයේදී සියයට 53·8 ක් විය. වසර තුළදී මහජනයා සතු, තැන්පතු, ව්‍යවහාර මුදල් වලට වඩා මඳක් වැඩි විය. 1961 දෙසැම්බර් මාසයේදී රුපියල් කෝටි 59·64 ක් වූ තැන්පතු 1962 දී රුපියල් කෝටි 63·0 ක් විය. මෙය රුපියල් කෝටි 3·36 ක වැඩිවීමෙකි.

සංඛ්‍යා සටහන II ඉ — 2

## මුදල් සැපැයුම් සැකැසුම

රුපියල් දශ ලක්ෂ

| කාලඡේදය අවසානයේදී | මහජනයා සතු නෝට්ටු හා කාසි | | මහජනයා සතු ඉල්ලුම් තැන්පතු | | මුළු මුදල් සැපැයුම |
|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මුළු මුදල් සැපැයුමෙහි සියයට ගණන | ප්‍රමාණය | මුළු මුදල් සැපැයුමෙහි සියයට ගණන | |
| 1953 .. .. | 335·3 | 40·6 | 491·5 | 59·4 | 826·8 |
| 1954 .. .. | 341·8 | 35·7 | 615·3 | 64·3 | 957·1 |
| 1955 .. .. | 384·5 | 35·8 | 688·4 | 64·2 | 1072·9 |
| 1956 .. .. | 401·1 | 35·6 | 725·7 | 64·4 | 1126·8 |
| 1957 .. .. | 434·9 | 41·8 | 605·2 | 58·2 | 1040·1 |
| 1958 .. .. | 529·8 | 49·2 | 546·9 | 50·8 | 1076·8 |
| 1959 .. .. | 565·0 | 48·0 | 612·7 | 52·0 | 1177·7 |
| 1960 .. .. | 595·3 | 49·2 | 613·6 | 50·8 | 1208·9 |
| 1961 .. .. | 692·2 | 53·8 | 596·4 | 46·2 | 1288.6 |
| 1962 .. .. | 712·6 | 53·1 | 630·0 | 46·9 | 1342·7 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

ඒ ඒ වටිනාකම් වලින් නිකුත් කොට ඇති නෝට්ටු ප්‍රමාණය විග්‍රහ කොට බලන විට, රුපියල් 10 නෝට්ටු හැර අනෙක් සියලුම වටිනාකම්වල නෝට්ටු නිකුතුව වැඩිවී තිබෙන බව හෙළිවෙයි. එහෙත් රුපියල් 100/- සහ රු. 50/- නෝට්ටු නිකුතුවේ සියයට ගණන අනෙක් වටිනාකම්වල නෝට්ටු නිකුතුවල සියයට ගණනට වඩා වැඩිවී තිබීම සැලකිය යුතු ලක්ෂණයකි. වැඩි වටිනාකම්වල නෝට්ටු වැඩි වීමෙන් හෙළිවනුයේ මහජනයා, නෝට්ටු බැංකුවල තැන්පත් නොකොට ළඟ තබා ගැනීමට වසර තුළ වැඩියෙන් ඉල්ලුම් කොට ඇති බවය.1960 අවසාන වන විට නිකුත් කොට තුබුණ රු. 100/– සහ රුපියල් 50/– නෝට්ටුවල වටිනාකම් රු. කෝටි 14·84 ක් විය. 1962 දෙසැම්බර් මාසයේදී තුබූ ප්‍රමාණයට අනුව පසුගිය දෙවසර තුළ, රු.100/– නෝට්ටු රුපියල් කෝටි 8·98 කින් රු. 50/– නෝට්ටු රුපියල් කෝටි 3·84 කින් වැඩිවී

ඇති බව පැහැදිලිවෙයි. අවුරුද්ද තුළ නිකුත් කරන ලද කාසි ප්‍රමාණයෙහි වෙනසෙක් සාමාන්‍යයෙන් ඇති නොවිණි. එහෙත් සත 50 කාසි නිකුතුව පමණක් රුපියල් දශ ලක්ෂයකින් වැඩිවිය.

පසුගිය අවුරුදු 6 තුළ මුදල් සැපැයුම වෙනස් වීමට හේතුවූ ප්‍රධාන සාධක සසඳා පහත සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II ඉ — 3

## මුදල් සැපැයුමෙහි වෙනස්වීම්

රුපියල් දශ ලක්ෂ

| මුදල් සැපයුම කෙරෙහි බලපාන සාධක | 1956 – 57 දෙසැම්බර් අග දක්වා | | 1957 – 58 දෙසැම්බර් අග දක්වා | | 1958 – 59 දෙසැම්බර් අග දක්වා | | 1959 - 60 දෙසැම්බර් අග දක්වා | | 1960 – 61 දෙසැම්බර් අග දක්වා | | 1961 – 62 දෙසැම්බර් අග දක්වා | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් | ප්‍රසාරණ හේතූන් | සංකෝචන හේතූන් |
| 1. බැංකු සතු විදේශීය වත්කම් (ශුද්ධ) .. | — | 209·2 | — | 82·2 | — | 195·0 | — | 170·2 | — | 78·6 | — | 91·1 |
| 2. වෙළෙඳ බැංකු ගනුදෙනු :— | | | | | | | | | | | | |
| (අ) පෞද්ගලික අංශයට දුන් ණය | 55·3 | — | 53·4 | — | 9·7 | — | 31·5 | — | 12·5 | — | 42·2 | — |
| (ආ) අතැති භාණ්ඩාගාර බිල්පත් හා රජයේ හා රජය ඇපවූ සුරැකුම් පත් .. | — | 7·4 | — | 39·6 | 30·2 | — | 6·0 | — | 21·4 | — | 71·3 | — |
| 3. මහ බැංකු:— ගනු දෙනු | | | | | | | | | | | | |
| (අ) රජයට දුන් ණය: .. | 32·6 | — | 75·0 | — | 61·8 | — | 21·9 | — | 1·9 | — | 3·0 | — |
| (ආ) භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ සහ රජය ඇපවූ සුරැකුම් පත් .. | 42·2 | — | 100·6 | — | 191·0 | — | 224·3 | — | 140·8 | — | 175·9 | — |
| (ඇ) අනෙකුත් වත්කම් හා ගිණුම් (ශුද්ධ) .. | — | 10·3 | 24·5 | — | — | 27·9 | — | 19·3 | — | 9·1 | — | 18·6 |
| 4. වෙළෙඳ බැංකුවල කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු සහ අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | — | 38·4 | — | 68·1 | — | 23·2 | — | 72·5 | — | 19·6 | — | 50·9 |
| 5. රජය සතු ව්‍යවහාර මුදල් ශේෂ .. | 49·3 | — | — | 36·4 | 64·0 | — | 8·0 | — | 9·4 | — | — | 76·1 |
| 6. ගැළපිළි. .. .. | — | 0·8 | 9·6 | — | — | 9·6 | 1·4 | — | 1·0 | — | — | 1·7 |
| ප්‍රසාරණ/සංකෝචන සාධක එකතුව .. .. | 179·4 | 266·1 | 263·1 | 226·3 | 356·7 | 255·7 | 293·1 | 262·0 | 187·0 | 107·3 | 292·4 | 238·4 |
| මුදල් සැපැයුමෙහි වෙනස .. .. | —86·7 | | +36·6 | | +101·0 | | +31·1 | | +79·8 | | +54·0 | |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

සංලක්ෂ්‍යය:— කලින් පළ කළ සංඛ්‍යාවනට වඩා වෙනස් වී ඇත්තේ පසුව කළ සංශෝධන නිසාය.

සාමාන්‍ය වශයෙන් සලකන විට, 1961 දී මුදල් සැපයුම වැඩි කිරීමට බලපෑ හේතුන්ම 1962 දී මුදල් සැපයුම වැඩි කිරීමෙහිලා ද බලපා ඇත. මුදල් සැපයුම වැඩි කිරීමෙහි ලා බලපවත් වන විශාලතම සාධකය වී ඇත්තේ, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ සහ රජය ඇප වූ සුරැකුම්පත්, වැඩිවීමය. මෙය 1961 දී රුපියල් කෝටි 14·08 ක් වූ අතර 1962 දී රුපියල් කෝටි 17·59 තෙක් වැඩිවිය. අනෙකුත් ප්‍රාසාරණාත්මක සාධක වූයේ වෙළෙඳ බැංකු ණය සහ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ හා රජය ඇප වූ සුරැකුම්පත් වැඩිවීමය. 1961 දී රුපියල් කෝටි 1·25 කින් වැඩි වූ වෙළෙඳ බැංකු ණය ප්‍රමාණය, 1962 දී රුපියල් කෝටි 4·22 කින් වැඩි විය. එසේම රුපියල් කෝටි 2·14 කින් වැඩි වූ භාණ්ඩාගාර බිල්පත් හා රජයේ සහ රජය ඇප වූ සුරැකුම්පත් රුපියල් කෝටි 7·13 කින් වැඩිවිය. මේ හැම සාධකයක්ම හේතුකොට 1962 දී ඇතිවූ ප්‍රාසාරණාත්මක බලපෑම පසුගිය වසරේදීට වඩා වැඩි වුවද, මුදල් සැපයුම අඩු කිරීමෙහි ලා බලපැවැත්වූ සාධක ද ප්‍රමාණවත් ලෙස ශක්තිමත් වූ නිසා මුදල් සැපයුමෙහි ඇතිවූ ප්‍රාසාරණයෙන් සෑහෙන කොටසක් සමහන් වී ගියේය. මුදල් සැපයුම සංකෝචනය කිරීමෙහි ලා බලපැවැත් වූ සාධක අතර, 1961 වසරේදී රුපියල් කෝටි 7·86 කින් පහළ වැටුන බැංකු විදේශීය වත්කම්, 1962 රුපියල් කෝටි 9·11 කින් පහළ වැටීමත් 1961 රුපියල් කෝටි 1·96 කින් වැඩි වූ කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු 1962 දී රුපියල් කෝටි 5 ·09 කින් වැඩිවීමත්, රුපියල් කෝටි 0·94 කින් අඩුවූ රජයේ මුදල් ශේෂ රුපියල් කෝටි 7·61 කින් වැඩිවීමත් ප්‍රධානතම විය. මෙසේ මුදල් සැපයුම වැඩි-අඩු කිරීමෙහි ලා බලපැවැත් වූ සාධක වල අවසාන ශුද්ධ ඵලය වූයේ 1962 වසරේදී මුදල් සැපයුම රුපියල් කෝටි 5·4 කින් වැඩිවීමය.

පසුගිය අවුරුද්දේ මුදල් සැපයුම කෙරෙහි සංකෝචන බලපෑමක් ඇතිකළ ඉතාමත් සැලකිය යුතු සාධකය වූයේ ගෙවුම් ශේෂය වුවද, ඉහත තොරතුරු අනුව සමාලෝචනයට භාජනය වී ඇති වසරේ මුදල් සැපයුම සංකෝචනයෙහි ලා බලපැවැත්වූ වැදගත්ම සාධක වී ඇත්තේ රජයේ මුදල් ප්‍රමාණය වැඩිවීමත්, මහජනයා සතු කාලීන හා ඉතිරි කිරීම් තැන්පතු වැඩි වීමත් බව හෙළිවෙයි. අනෙක් අතට, 1959 දී සහ 1960 දී මෙන් විදේශීය වත්කම් වේගයෙන් අඩු වී ගියේ නම්, සමහර විට මුදල් සැපයුමෙහි වැඩිවීම මෙයට වඩා අඩුවිය හැකිව තිබිණි. 1959 සහ 1960 ඇතිවූ හැඩ ගැස්ම අනුව බලන විට ප්‍රධාන වශයෙන් ආනයන සීමා කිරීම නිසාත්, රජය සහ මහජනයා සිය මුදල් ශේෂයන් වැඩිකර ගැනීමට දක්වූ උනන්දුව නිසාත්, විදේශීය වත්කම් අඩු වශයෙන් පහළ වැටී ඇති බව මුදල් සැපයුමෙන් පිළිබිඹු වෙයි.